(i) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය	අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු විස්තර පොදු 96 ආකෘති පත්‍රය මඟින් විගණකාධිපතිට මාසිකව වාර්තා කර නොතිබුණි. විශ්වවිද්‍යාල පද්ධතිය තුල මෙම පරිචය නොමැති බව උපකුලපතිවරයා විසින් මා වෙත දැනුම් දෙන ලදී.

4

(ii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෛනික පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර විශ්වවිද්‍යාලය විසින් ගෙන නොතිබුණි. සම්ප්‍රදායක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරන බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා විසින් මා වෙත දන්වන ලදී.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396	විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද රු.24,502 ක් වටිනා චෙක්පත් 10 ක් වර්ෂයකට වැඩි කාලයක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මුළු චෙක්පත්වල වටිනාකම වූ රු.4,579,874 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ජංගම වගකීම් ලෙස පෙන්වා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.157,502,871 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.76,652,728 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.80,850,143 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි සහ කොන්ත්‍රාත් සේවාවල වියදම්, පිළිවෙලින් රු.174,848,703 කින් හා රු.35,370,733 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

(අ) **විභාග ප්‍රතිඵල**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ අංක 636 දරණ 1995 ජුලි 14 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස තුනක් ඇතුළත නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, 2015 අප්‍රේල්, ජුලි සහ අගෝස්තු මාසවලදී පවත්වන ලද බාහිර උපාධි පාඨමාලාවල විභාග ප්‍රතිඵල සැලකිය යුතු කාල ප්‍රමාදයකින් පසුව 2016 ජුනි 8 දින නිකුත් කරන ලදී. විස්තර පහත දැක්වේ.

පීඨය/ දෙපාර්තමේන්තුව	විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	විභාගය පැවැත්වූ මාසය	2016 මැයි දින වනවිට ප්‍රමාදය
			මාස
වාණිජ හා කළමනාකරණ පීඨය			
1 වසර - 2010/ 2011	160	2015 අගෝස්තු	08
2 වසර - 2010/ 2011 (නැවත ලිවීම)	51		
කෘෂිකර්ම පීඨය			
1 සහ 2 වසර (නැවත ලිවීම)	04	2015 ජුලි	09
හෙද දෙපාර්තමේන්තුව			
1 වසර, 1 වැනි වර්ෂාර්ධය 2010 / 2011 (යළි ලිවීම)	04	2015 අප්‍රේල්	09

6

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ආ) ශිෂ්‍යයින් බඳවාගැනීම

සමාලෝචිත වර්ෂය තුල සහ ඉකුත් වසර තුන තුළ එක් එක් පීඨය සඳහා ඇතුළත් කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

පීඨය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			
	2015	2014	2013	2012
කෘෂිකර්ම	39	118	83	65
කලා හා සංස්කෘතික	463	210	276	543
වාණිජ හා කළමනාකරණ	154	208	201	180
විද්‍යා	64	192	214	151
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා	36	89	80	101
එකතුව	756	817	854	1040

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී කෘෂිකර්ම සහ විද්‍යා පීඨවලට බඳවාගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 67 කින් අඩු වී තිබූ අතර කලා සහ සංස්කෘතික පීඨයට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 120 කින් වැඩිවිය.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී සියලුම පීඨවලට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2012 වසර හා සැසඳීමේදී සියයට 27 කින් අඩු වී තිබුණි.

7

(ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂ තුනක කාලපරිච්ඡේදය තුලදී විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

	2015	2014	2013	2012
මුළු පිරිවැය (රු.'000)	958,198	586,471	627,796	427,087
මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	4,203	3,810	3,158	2,769
ඒක ශිෂ්‍ය පිරිවැය (රු.'000)	228	154	199	154

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය සියයට 48 කින් වැඩිවිය.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාල පරිපාලනය

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 7 දෙනෙකු විසින් රැගෙන යන ලද පුස්තකාල පොත් 27 ක් නියමිත කාලය ඇතුළත ආපසු භාර නොදී වසර 1 සිට 5 අතර කාලයක් රඳවාගෙන තිබුණි. කෙසේ වෙතත්, එකී පොත් ආපසු ලබාගැනීමට හෝ ප්‍රමාදයන් සඳහා රු.43,183 ක දඩ මුදලක් අයකරගැනීමට හෝ විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) පර්යේෂණ අත්තිකාරම් නිරවුල් කිරීම

පර්යේෂණ පැවැත්වීම සඳහා කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට 2014 වර්ෂයේදී ගෙවන ලද පර්යේෂණ ආධාර අත්තිකාරම් රු.82,850 ක් 2016 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබාදීම

කලා සහ සංස්කෘතික පීඨයේ 1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුට එකී පීඨයේ ආචාර්ය උපාධි වැඩසටහනක් කරගෙන යාම සඳහා 2010 ඔක්තෝබර් 01 දින සිට 2011 මාර්තු 31 දින දක්වා අධ්‍යයන නිවාඩු ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 ඔක්තෝබර් 01 දින විශ්වවිද්‍යාලය සමඟ එළඹි බැඳුම්කර ගිවිසුම අනුව ඇයගේ අධ්‍යයන නිවාඩු නිම කළ පසු විශ්වවිද්‍යාලයට අනිවාර්ය අවුරුදු 5 ක සේවයක් සැලසිය යුතුය. කෙසේ වෙතත්, ඇයගේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2014 පෙබරවාරි 11 දින සිට බලපැවැත්වෙන පරිදි 2015 ජනවාරි 29 දින ඇය සේවයෙන් විශ්‍රාම යන ලදී. මේ සම්බන්ධයෙන් රු.2,534,659 ක් වූ බැඳුම්කර වටිනාකම ඇපකරුගෙන් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ii) ඇයගේ විශ්‍රාම යන දිනය දක්වා වූ විශ්වවිද්‍යාලයේ සේවය කළ හැකි ඉතිරි සේවා කාලය සැලකිල්ලට නොගෙන, නිවාඩු සහ ප්‍රදාන කමිටුව විසින් එකී කථිකාචාර්යවරියට ආචාර්ය උපාධි වැඩසටහන කරගෙන යාම සඳහා පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

(iii) 2011 අප්‍රේල් 20 දිනැති අංක 01/ 2011 දරන උසස් අධ්‍යාපන චක්‍රලේඛය සහ 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පර්යේෂණ දීමනාව ලබාගැනීමට පර්යේෂණ යෝජනා, පර්යේෂණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් කථිකාචාර්යවරිය පර්යේෂණ කටයුතු සඳහා අළුත් යෝජනාවක් ඉදිරිපත් නොකර 2011 සිට 2015 දක්වා වසර 5 ක කාලපරිච්ඡේදය සඳහා පර්යේෂණ දීමනා වශයෙන් එකතුව රු.923,708 ක් ලබාගෙන තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඇ) බැඳුම්කර කඩකිරීම

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ඉන්දියාවේ මදුරාසි විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි වැඩසටහන සඳහා 2012 මාර්තු 05 දින, උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් (NCAS) රු.368,500 ක ප්‍රදානයක් ලබාගන්නා ලදී. නමුත් ඔහු 2016 ජූනි 30 දින වනතුරුත් ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් රු.368,500 ක බැඳුම්කර වටිනාකම ගිවිසුම ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුබලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි මස 24 දින පැවැති විගණන කමිටු රැස්වීම අනුව, පරිගණක 155 ක් හා යූපී-එස් 06 ක් ප්‍රසම්පාදනයේදී සිදු වූ රු.4,233,370 ක පාඩුව ඊට වගකිවයුතු නිලධාරීන් තිදෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, 2016 මැයි 31 වනතුරුත් එකී පාඩුව අයකරගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 73 දෙනෙකු ශිෂ්‍යත්ව මත විදේශගත වී තිබූ නමුත් එය නිම වූ පසු ආපසු රාජකාරී සඳහා වාර්තාකර නොතිබුණි. කෙසේ වෙතත්, ඔවුන්ගෙන් අයවිය යුතු එකතුව රු.156,535,552 ක මුදල වසර 5 සිට වසර 20 අතර කාල පරාසයක් තුල හිඟව පැවතියත් විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම් කඩකිරීම මත පැන නැඟුණු එකී ශේෂ ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙයින් සිද්ධි 12 ක් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කර පැහැර හැරී අයගෙන් අයකරගැනීමට නීතිපතිවරයා වෙත භාර දී ඇති බව මේ සම්බන්ධයෙන් උප කුලපතිවරයා මා වෙත දන්වන ලදී.

(ඇ) ත්‍රිකුණාමලය මණ්ඩපයේ 2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව නිවාඩු නිකේතනයේ, ඩොක්යාර්ඩ් පාර නේවාසිකාගාරය, ආපන ශාලාව සහ මණ්ඩපයේ නඩත්තු අංශයේ රු.මිලියන 1.19 වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 167 ක් නැතිවී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් නැතිවීමට හේතු සොයා බැලීමට හෝ එකී අලාභයට වගකිවයුත්තන්ට වගකීම පැවරීමට හෝ කටයුතු කර නොතිබුණි.

10

4.4 කොන්ත්‍රාත් පරිපාලනය

ත්‍රිකුණාමලය මණ්ඩපයේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම

2014 අප්‍රේල් 19 දින පිරිවැය රු.32,447,463 කට ත්‍රිකුණාමලය ක්‍රීඩාපිටිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු අතර කොන්ත්‍රාත්කරු රු.24,765,167 ක මුදලක් ලබාගැනීමෙන් පසු ඉදිකිරීම් වැඩ අත්හැර දමා තිබුණි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් වලංගු කාලය තුල කාර්යසාධන බැඳුම්කරය මුදල් කර කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

4.5 මානව සම්පත් කළමනාකරණය

මහාචාර්යවරුන් 19 දෙනෙකුගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා කථිකාචාර්යවරුන් 65 දෙනෙකුගේ පුරප්පාඩු පැවැති අතර මෙම තත්ත්වය ශිෂ්‍ය ප්‍රජාවගේ අධ්‍යයන කටයුතු සඳහා හානිකර ලෙස බලපා තිබුණි. කෙසේ වෙතත්, මෙකී තනතුරුවල පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලය 2016 ජූලි 31 දින වනතුරුත් විධිමත් පියවර ගෙන නොතිබුණි.

4.6 වත්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "Tissue Processor" හි ප්‍රධාන උපාංගයක් මිලදී නොගැනීම හේතු කොටගෙන 2012 වර්ෂයේදී රු.මිලියන 2.875 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද "Eight accessories of the tissue processor" නැමැති වෛද්‍ය උපකරණ මිලදී ගත් දින සිට සෞඛ්‍යාරක්ෂක විද්‍යා පීඨයේ නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් 2012 ජූලි 04 දින රු.2,994,370 ක් වටිනා "mortuary cooling chamber" නැමැති වෛද්‍ය උපකරණයක් මිලදීගෙන මානව ජීව විද්‍යා දෙපාර්තමේන්තුවේ කායච්ඡේද විද්‍යා රසායනාගාරයට භාර දී තිබුණු නමුත් විශ්වවිද්‍යාලය විසින් එකී උපකරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය 10KV UPS උපාංගය සපයා නොතිබුණි. එබැවින් එය 2016 අප්‍රේල් 07 දින දක්වා නිශ්ක්‍රීයව පැවතුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2016 අප්‍රේල් 04 දිනදීය.

5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය පරිදි ඉකුත් වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳව සමාලෝචනයක් සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. තවද ඉටුකරගත යුතු ඉලක්කවල මූල්‍යමය වටිනාකම් එහි පිළිබිඹු නොකෙරුණු අතර ඒ නිසා වාර්ෂික ප්‍රගතිය ඇගයිය හැකි වන ආකාරයෙන් සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය අනුව විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි විශ්වවිද්‍යාලයේ යාවත්කාලීන කළ සංවිධාන සැලැස්මට වර්තමාන අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් භෞතික ප්‍රගතිය මැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට කලා හා සංස්කෘතික පීඨය විශ්වවිද්‍යාලය විසින් ඇතුලත් කර නොතිබුණි.

12

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 4.2.1 (අ) සහ 4.2.3 වගන්ති ප්‍රකාරව යටත් පිරිසෙන් වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් තුලදීවත් ඉටුකරගැනීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඒ වෙනුවට, වර්ෂයක කාලයක් සඳහා පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

5.5 පිළිතුරු නොසැපයූ විගණන විමසුම්

2015 වර්ෂයේ ජූනි මාසයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 24 කින් තුනකට 2016 ජූනි 30 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ)	ස්ථාවර වත්කම් පාලනය	-	සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල සාධාරණ අගය ඉදිරිපත් කිරීම.
(ආ)	කොන්ත්‍රාත් පරිපාලනය	-	ප්‍රමාද වන්දි අයකර ගැනීම, කාලය දීර්ඝ කිරීම් අනුමත කිරීම සහ කොන්ත්‍රාත් ගිවිසුම්වල කොන්දේසි වලට අනුකූල වීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

13

23. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාලව කළමනාකරණයේ හේතු පැහැදිලි කිරීම.

විගණන ජේද යොමුව		නිරීක්ෂණයන්
2.2 මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයඃ **2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුගත වීමඃ**		
	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව ඉඩම් හා ගොඩනැගිලි ඒවා එකවිට අත්පත් කරගන්නා විටදී වෙන වෙන ම ගිණුම් ගත කල යුතුය. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලයේ 2015.12.31 දිනට රු. 916,154,072.00 ක ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම එසේ වෙන් වෙන් වශයෙන් පෙන්නුම් නොකර ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ පෙන්නුම් කර තිබුණි.	එකඟවෙමි. උපදේශක වරයෙකුගේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට (ශ්‍රී.ලං.නැ.වි.වි)අයත් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගනනය කිරීමේ සහ අයිතිය නිරවුල් කිරීමේ ක්‍රියාවලිය මේ වන විටත් ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලිය අවසන් වූ වහාම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගනන වටිනාකම් 2016 වර්ෂය සඳහා පිළියෙල කරණු ලබන මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.
2.2.2 ගිණුම්කරණ අඩුපාඩු		
	රු.19,411,037.00 ක වටිනාකමකින් යුත් ලී බඩු, උපකරණ, පොත් සහ රථවාහන මඩකලපුව දිස්ත්‍රික්කයේ පැවති යුද වාතාවරණය හේතුවෙන් 1990 වසර තුල නැතිවී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ගිණුම් ප්‍රකාශන තුල සිදුකර නොතිබුන අතර මේ හේතුවෙන් ස්ථාවර වත්කම් වල වටිනාකම එම වටිනාකමෙන් වැඩියෙන් සටහන් කර තිබුණි.	එකඟ නොවෙමි. පාඩුවේ සම්පූර්ණ වටිනාකම ක් වේ. භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය මේ දක්වා ලැබී නොමැති බැවින් ගිණුම් ප්‍රකාශන තුල කිසිදු ගැලපීමක් මේ දක්වා සිදු කර නොමැත. මූල්‍ය රෙගුලාසි 102 ප්‍රකාරව රු.19,411,037.00 ක පාඩුව පොත් වලින් ලිහා හැරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ඉල්ලා සිටීමට මේ වන විටත් කටයුතු කර ඇත. අදාල අනුමැතිය ලද විගස ගිණුම් ප්‍රකාශන තුල අවශ්‍ය ගැලපීම්

		සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
2.2.3 ලැබිය යුතු ගිණුම්		
(අ)	රු. 9,716,548.00 ක වටිනාකමින් යුත් ණය ශේෂයන් අයකර ගැනීමකින් තොරව වසර පහකට වඩා අධික කාලයක් සේවයෙන් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා විශ්වවිද්‍යාලයෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය නිළධාරීන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.	එකඟවෙමි. අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීම සඳහා පහත පරිදි කටයුතු කරනු ලැබේ. • **සේවය අවසන් කල නිළධාරීන්:** මෙම කාර්ය මණ්ඩලය මේ දක්වා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ඉල්ලුම් කර නොමැත. නිරවුල් නොකරන ලද ණය සහ වැටුප් අත්තිකාරම් ඔවුන් විසින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ආපසු ගෙවන ලෙස ඉල්ලුම් කිරීමේ දී ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. • **ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිට ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය වෙත ස්ථාන මාරුවීම් ලැබ ගිය නිළධාරීන්:** රු.1,394,928.00 ක වටිනාකමින් යුත් ණය ශේෂයන් සහ වැටුප් අත්තිකාරම් ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය වෙත මාරු කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සංදේශයක් මුදල් කමිටුවට යොමු කල අතර ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ගිණුම්

		වාර්තා වලින් ඉවත් කිරීමට පාලක සභාවේ අනුමැතිය මත කටයුතු කර ඇත. • **සේවය හැර ගිය හා ගිවිසුම් කඩ කල නිළධාරින්:** අදාල සේවකයන්ගෙන් ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට නීතිපති වරයාගේ උපදෙස් මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටින අතර ඔවුන් විසින් අදාල ගිවිසුම් වටිනාකම් නිරවුල් කිරීමේ දී අයවිය යුතු ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. • **සේවයෙන් විශ්‍රාම ගිය කාර්ය මණ්ඩලය:** සේවයෙන් විශ්‍රාම ගිය නිළධාරීන්ට ලිපි යැවීම මගින් ලැබිය යුතු ණය සහ වැටුප් අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. එසේම අයවිය යුතු ශේෂ නොමැති බවට වන සහතිකය නිකුත් කිරිමට අදාල වගකිව යුතු නිළධාරීන් හඳුනාගැනීම සම්බන්ධයෙන් වන විමර්ශනයක් ආරම්භ කර ඇති අතර ඒ අනුව වගකිව යුතු නිළධාරීන්ගෙන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. • **අනෙකුත් විශ්වවිද්‍යාල/ රාජ්‍ය දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුවීම් ලැබ ගිය නිළධාරීන්:** අදාල ආයතන වල උපදෙස් මත අයවිය යුතු ණය සහ වැටුප් අත්තිකාරම් ස්ථාන මාරුවීම් ලැබ ගිය නිළධාරීන්ගෙන්

		අයකර ගැනීමට මේ වන විටත් කටයුතු කර ඇත.
(ආ)	රු. 5,000,378.00 ක වටිනාකමෙන් යුත් විදේශ සැපයුම්කරුවන් වෙත ගෙවන ලද අත්තිකාරම් ආනයන අත්තිකාරම් ගිණුම් 135 ක වසර 11 කට වඩා අධික කාලයක් නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව පවතී.	එකඟවෙමි. බොහෝමයක් සැපයුම් අත්තිකාරම් 1990 වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම වර්ෂයේ පැවති වාතාවරණයට අනුව ඇනවුම් කරන ලද භාණ්ඩ කොළඹ ආශ්‍රිත සැපයුම්කරුවන්ගෙන් මිලදී ගන්නා අවස්ථාවේ ම මුදල් ගෙවා ලබා ගත යුතුව පැවතුණි. එමනිසා සෘජුවම ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා චෙක්පත් කලින් ලිවීමට කටයුතු කර ඇති අතර අදාල භාණ්ඩ ලද විගස මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙය විධිමත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
(ඇ)	රු. 18,696,666.00 ක වටිනාකමෙන් යුත් විවිධ සැපයුම්කරුවන් වෙත ලබා දුන් අත්තිකාරම් අයකර ගැනීමකින් තොරව වසර 5 සිට 19 දක්වා කාල පරාසයක පවතින අතර මේවා අයකර ගැනිමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	

2.2.4නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති රෙගුලාසි වලට යොමුව			**අනුකූල නොවීම**
(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය			
(i)	Xපරිච්ඡේදයේ 20.6 වගන්තිය	වැටුප් රහිත නිවාඩු ලබා ගත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර පොදු ආකෘතිඃ 96 න් මාසිකව විගණකාධිපතිවරයාට වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. මෙවැනි සම්ප්‍රදායක් විශ්වවිද්‍යාලය තුල නොමැති බව උපකුලපති වරයා මා වෙත වාර්තා කර ඇත.	එකඟවෙමි. මෙයවිශ්වවිද්‍යාල පද්ධතිය තුල ක්‍රියාත්මක නොවේ.

(ii)	XXVII පරිච්ජේදයේ 3.1 වගන්තිය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛණයක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා මා වෙත දනුම් දුන්නේ සම්ප්‍රදායක් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්ප්‍රදායක් ලෙස පැමිණීම සහ පිටව යාම සටහන් නොකරන බවයි.	එකඟවෙමි. අනෙකුත් සියළු ම විශ්වවිද්‍යාල වල මෙන් අධ්‍යයන කාර්යමණ්ඩලයේ සම්ප්‍රදායක් ලෙස පැමිණීම හා පිටව යාම සටහන් කරනු නොලැබේ.

(ආ)	ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි		
(i)	මුදල් රෙගුලාසි 396	විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන රු. 24,502.00ක වටිනාකමෙන් යුත් චෙක්පත් 10 ක් වර්ෂයකට අධික කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකර පැවතුනි. කෙසේ වෙතත් රු. 4,579,874.00 ක වටිනාකමකින් යුත් මුළු ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත් වල වටිනාකම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව ජංගම වගකීමක් ලෙස පෙන්නුම් කර තිබුණි.	එකගවෙමි. රු. 24,502.00 ක වටිනාකමෙන් යුත් මාස 6 කට වඩා අධික කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණු චෙක්පත් වල වටිනාකම අවලංගු කර අදාල ගැලපීම් ලෙජර් ගිණුම් වල වගකීමක් ලෙස සටහන් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පෙර වර්ෂයේ පැවති රු. 76,652,728.00 ක ඌනතාවයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 157,502,871.00 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 80,850,143.00 කින් තවදුරටත් පහල යාමක් ලෙස වාර්තා වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලය පහල යාමට මූලික වශයෙන් පෞද්ගලික පඩිනඩි හා ගිවිසුම්ගත සේවා යන වියදම් පිළිවෙලින් රු. 174,848,703.00 හා රු. 33,370,733.00 ලෙස පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහල යාම හේතු සාධක වී තිබුණි.	මෙම මූල්‍ය ප්‍රතිඵලය සඳහා හේතු සාධකව ඇත්තේ පහත සඳහන් කරුණු හේතුවෙන් අයවැය ගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමට සිදුවීමයි. 1. විශ්වවිද්‍යාලයේ පෞද්ගලික පඩිනඩි වියදම් රු. 704,978,168.00 ක් ලෙස 32.98% කින් ඉහල ගොස් ඇත. පෞද්ගලික පඩිනඩි ඉහල යාමට ප්‍රධාන හේතු වන්නේ; ▪ සියළුම විශ්වවිද්‍යාල සේවකයින් සඳහා මාසික අන්තර් දීමනාව රු. 10,000.00 කින් ඉහල යාම (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 03/2015) ▪ 2015 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළුම අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා 20% ක මාසික හිලව් දීමනාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන

		කොමිෂන් සභාව විසින් හඳුන්වා දීම. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංකඃ 02/2015) ▪ 2015 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩල දීමනාව ඉහල දැමීම. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංකඃ 1000) 2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 ජූලි01 සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රවාහන සහ ඉන්ධන දීමනා ගෙවීම හඳුන්වා දීම. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංකඃ 13/2015) 3. ගිණුම්ගත සේවා මත වියදම් රු. 167,615,260.00 ක් ලෙස 26.75% කින් ඉහල යාම. 4.රු.173,456,597.00 ක්වන ක්ෂය ප්‍රතිපාදන සහ ක්‍රමක්ෂය වියදම් මූල්‍ය නොවන වියදම් වේ.මේ හේතුවෙන් විශ්වවිද්‍යාලයේමුළු මෙහෙයුම් වියදම් ඉහල ගොස් ඇත.
4. මෙහෙයුම් සමාලෝචනය **4.1 කාර්ය සාධනය**		
(අ) විභාග ප්‍රතිඵල		
	1995 ජූලි 14 දිනැති හා අංක 636 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විභාග පවත්වා මාස 3 ක් ඇතුලත විශ්වවිද්‍යාලය විසින් ප්‍රතිඵල නිකුත් කල යුතුය. කෙසේ වෙතත් 2015	එකඟ වෙමි. බාහිර විභාග ප්‍රතිඵල ප්‍රමාදය සිසුන් කණ්ඩායම් දෙකක් එකවර බඳවා ගැනීම සහ කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතියදී

	අප්‍රේල් ජූනි සහ අගෝස්තු මස පවත්වන ලද බාහිර උපාධි පාඨමාලාවන්ට අදාල ප්‍රතිඵල සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව විශ්වවිද්‍යාලය විසින් 2016 ජූනි 08 වන දින නිකුත් කර තිබුණි.	ඇතිවූ අමතර වැඩ හේතුවෙන් සිදුවී ඇත. කෙසේ වෙතත් සියළු පාඨමාලාවන්ට අදාල ප්‍රතිඵල මේ වන විටත් නිකුත් කර ඇත.
(ආ) ශිෂ්‍ය ලියාපදිංචි කිරීම		
	(i) කෘෂිකර්ම පීඨයට සහ විද්‍යා පීඨයට සමාලෝචිත වර්ෂයට සිසුන් ලියාපදිංචි කිරීම පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් 67% කින් හා 67% අඩුවී තිබූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කලා හා සංස්කෘත පීඨයේ සිසුන් ලියාපදිංචිය 120% කින් ඉහල ගොස් තිබුණි.	ශිෂ්‍ය වෙන්කිරීම් / ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන අතර විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ලබා දෙන වෙන්කිරීම් වලට අදාලව සිසුන් ඇතුලත් කිරීම සිදු කරනු ලබයි.
	(ii) 2012 වර්ෂයට සාපේක්ෂව සියළුම පීඨ සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය සමාලෝචිත වර්ෂයේදී 27% කින් පහල ගොස් තිබුණි.	
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව 48% කින් ඉහල ගොස් තිබුණි.	සටහන්කර ගතිමි.
4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා		
(අ)	**පුස්තකාල පරිපාලනයඃ** අධ්‍යයන කාර්යමණ්ඩලයේ සේවකයන් 07 දෙනෙකු විසින් ලබාගත් පුස්තකාල පොත් 27, වසර 1 සිට වසර 5 ක කාල සීමාවක් තුල ආපසු භාරදීමෙන් තොරව පැවතුනි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය විසින් අදාල පොත් ආපසු ලබා ගැනීමට හෝ ප්‍රමාදය සඳහා රු. 43,183.00 ක දඩ මුදලක් නියම කිරීමට කටයුතු කර නෙතිබුණි.	එකඟ වෙමි. පාලක මණ්ඩලයේ අනුමැතිය මත අදාල පොත් ලබාගත්, දැනටමත් සේවයේ යෙදී සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අදාල පොත් ආපසු ලබා ගැනීමට හෝ දඩ මුදල් අය කර ගැනීමට මේ වන විටත් කටයුතු කර ඇත. විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත්ව ගිය කාර්ය මණ්ඩලය ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී අදාල පොත් පත්වල වටිනාකම සහ දඩ මුදල් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ආ)	**පර්යේෂණ අත්තිකාරම් නිරවුල් කිරීම:** විශ්වවිද්‍යාලයේ අචාර්යවරුන් දෙදෙනෙකුට පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා 2014 දී ලබාදුන් රුපියල් 82,850.00 ක පර්යේෂණ අත්තිකාරම් 2016 ජූනි 30 වන විටත් නිරවුල් නොකර පැවතුනි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මෙය විමර්ශනය කරමින් පවතී.
(ඇ)	**අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබා දීම:** කලා හා සංස්කෘත පීඨයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය-I ශ්‍රේණියේ කථිකාචාර්යවරයෙකු සඳහා මෙම පීඨයේ දර්ශනශූරී උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා 2010 ඔක්තෝම්බර් 01 සිට 2011 මාර්තු 31 දක්වා වැටුප් සහිත නිවාඩු ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත ගැටළු නිරීක්ෂණය කරන ලදි.	
	(i) 2010 ඔක්තෝම්බර් 01 සිට විශ්වවිද්‍යාල සමග ඇතුලත් වූ බැඳීම් ගිවිසුමට අනුව අධ්‍යයන නිවාඩු අවසන් කල පසු අනිවාර්යෙන්ම විශවවිද්‍යාලයේ වසර 5 ක් සේවය කල යුතු වේ. කෙසේ වෙතත් ඇය 2014 පෙබරවාරි 11 වන දින විශ්වවිද්‍යාලයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇත. මේ සම්බන්ධයෙන් රු. 2,534,659.00 ක් වන බැඳීම් වටිනාකම ඇපකරයෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. (ii) විශ්‍රාම යන දිනය දක්වා විශ්වවිද්‍යාලයට සේවය කිරීමට ඉතිරිව ඇති කාලය පිළිබඳව සැලකීමකින් තොරව නිවාඩු හා තිළිණ කමිටුව විසින් දර්ශනශූරී උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා වැටුප් සහිත නිවාඩු අනුමත කර තිබුණි. (iii)2011 අප්‍රේල් 20 දිනැති හා අංක 01/2011 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය හා 2011 පෙබරවාරි 11 දිනැති 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පර්යේෂණ දීමනා ලබාගැනීම සඳහා පර්යේෂණ යෝජනාවක් පර්යේෂණ කමිටුවේ අනුමැතිය සහිතව ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත් ඉහත නම් සඳහන් කථිකාචාර්යවරිය 2011	මූලිකව එකග වෙමි. මෙම කරුණ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සොයා බලමින් පවතී.

	සිට 2015 කාල සීමාව සඳහා එකතුව රු.923,708.00 ක් වන පර්යේෂණ දීමනාවන් පර්යේෂණ දීමනාවන් පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා නව යෝජනාවක් ඉදිරිපත් කිරීමකින් තොරව ඇය විසින් දර්ශනශූරි උපාධි පාඨමාලාවට ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනාව වෙනුවෙන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි.	
(ඈ)	**ගිවිසුම් කඩ කිරීම** : සමාජ විද්‍යා පීඨයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු ඉන්දියාවේ මදුරාසි විශ්ව විද්‍යාලයේ දර්ශනශූරි උපාධිය හැදෑරීම සඳහා රු. 368,500.00 ක මුදලක් 2012 මාර්තු 05 වන දින උසස් අධ්‍යාපනය සඳහා වන ජාතික මධ්‍යස්ථානයෙන් ලබා තිබුණද 2016 ජූනි 30 වන විට අදාල දර්ශනශූරි පාඨමාලාව අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත් ගිවිසුමට අනුව බැඳීම් වටිනාකම වන රු. 368,5000.00 ක මුදල අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.	එකඟවෙමි. ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
4.3 කළමනාකරණ දුර්වලතා		
(අ)	2014 ජූනි 24 පැවති විගනන කමිටු රැස්වීමේදී පරිගණක 155 ක් සහ යු.පී.එස්. 6 ක් මිලදී ගැනීමේදී විශ්වවිද්‍යාලයේ සිදුවූ රු. 4,233,370.00 ක මුදල ඊට වගකිව යුතු නිළධාරීන් තිදෙනෙකුගෙන් අයකර ගැනීම සඳහා නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත් 2016 මාර්තු 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	එකඟ නොවෙමි. 2016 ජූලි 23 පැවති 246 වන පාලක සභා රැස්වීමේදී විගණන කමිටුවේ අදාල නිර්දේශය සහ පරිගණක 155 ක් සහ යු.පී.එස්. 6 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් ලේඛකාධිකාරීවරයා ඉදිරිපත් කරන ලද වාර්තාව නැවත සලකා බැලීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන ලදී. • කෙසේ වෙතත් අදාල කමිටු වාර්තාව නියමිත කාල සීමාව තුල නොලැබුණු බැවින් 2016 ජනවාරි 29 වන දින පැවති 261 වන පාලක සභා රැස්වීමේදී මෙය කාලයක් තිස්සේ පැවත එන අවිනිශ්චිත ගැටළුවක් බැවින් පහත කරුණු සැලකිල්ලට ගෙන අවවාදාත්මක ලිපි

		නිකුත් කර අවසන් කිරීමට තීරණය කරන ලදි. • ප්‍රථම විධිමත් පරීක්ෂණය මගින් මෙයට සම්බන්ධ පුද්ගලයින් මෙය හිතාමතා සිදුකරන ලද පාඩුවක් නොවන බවත් වංචාවක් සඳහා කිසිදු සාක්ෂියක් නොමැති බවත් සඳහන් කර තිබුණි. • විමර්ශන ක්‍රියාවලිය සඳහා අධික ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර මේ කාලය තුල චෝදනා ලැබූ එක් නිළධාරියෙකු මිය යාම. • බලපත්‍ර සුවියන් වෙනුවට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය පරිගණක සහ යු.ජී.එස්. 15 ක් මේ වන විටත් ලබාගෙන ඇති බැවින් මේ සම්බන්ධයෙන් කිසිදු පාඩුවක් සිදුවී ඇති බවට නිරීක්ෂණය නොවීම.
(ආ)	ශිෂ්‍යත්ව මත විදේශ ගත වූ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරු 73 දෙනෙකු ශිෂ්‍යත්ව අවසන් වූ පසුව ද සේවයට වාර්තා කර නොතිබුණි. කෙසේ වෙතත් වසර 5 සිට වසර 20 ක කාල සීමාවක් තුල නිරවුල් නොකර පවතින මුළු එකතුව රු. 156,535,552.00 ක් වන වටිනාකම අදාල කථිකාචාර්යවරුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල උපකුලපතිවරයා මා වෙත දන්වා සිටියේ නීතිමය ක්‍රියාමාර්ග ගෙන අදාල පුද්ගලයින්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා නඩු 12 ක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට කටයුතු කර ඇති බවයි.	අර්ධ වශයෙන් එකඟ වෙමි. • ගිවිසුම් කඩකර ඇති පුද්ගලයින් 74 දෙනෙකු ඇතුලත් නඩු 12 ක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන මුදල් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදීමට කටයුතු කර ඇත. රජයේ නීති උපදේශකවරුන් දෙදෙනෙකු මෙම නඩු භාරව කටයුතු කරයි. ගිවිසුම් කඩකල පුද්ගලයන්ගෙන් මිලියන 10 ක් අයකර ගැනීමට මේ වන විටත් කටයුතු කර ඇත.

		• වසර 10 ක කාලසීමාව තුල නඩු සම්බන්ධයෙන් ප්‍රමුඛතා පදනම මත මුලින් ක්‍රියාත්මක වීමටත් වසර 10 කට වඩා වැඩි නඩු සම්බන්ධයෙන් පසුව සලකා බැලීමටත් කටයුතු කරන බව නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇත. • නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
(ඇ)	ත්‍රිකුණාමල මණ්ඩපයේ 2014 වර්ෂය සඳහා වන සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව සංචාරක බංගලාවේ, ඩොක්යාර්ඩ් පාරේ නේවාසිකාගාරයේ, ආපනශාලාවේ සහ මණ්ඩපයේ නඩත්තු ඒකකයේ තබා තිබූ රු. මිලියන 1.19 ක වටිනාකමෙන් යුත් ඉන්වෙන්ට්‍රි අයිතම 167 ක් නැතිවී ඇති බව වාර්තා වී ඇත. කෙසේ වෙතත් අදාල හානි සම්බන්ධයෙන් විමර්ශනය කොට මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අදාල වගකිව යුතු නිළධාරීන් හදුනාගැනීම සඳහා මණ්ඩපය කටයුතු කර නොතිබුණි.	අර්ධ වශයෙන් එකඟ වෙමි. ත්‍රිකුණාමල මණ්ඩපයේ පාලන අංශය මගින් සිදු කරන ලද විමර්ශනයකට අනුව අනාවරණය කරගෙන ඇත්තේ සත්‍යාපක්ෂණ ක්‍රියාවලිය අතරතුර නැතිවී ඇති අයිතම වෙනත් ස්ථානයක ගබඩා කර ඇති බවත් අදාල නව කාර්ය මණ්ඩලය/නිළධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් වී නොමැති බවත් ය. අදාල සොයාගැනීම් වලට අනුව 2015 වාර්ෂික සමීක්ෂණය අතර අදාල ගැලපීම් සිදුකිරීම සඳහා මේ වන විටත් ක්‍රියාකරමින් පවතී.
4.3 කොන්ත්‍රාත් පරිපාලනය		
	ත්‍රිකුණාමල මණ්ඩපයේ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම	
	ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා 2014 අප්‍රේල් 19 වන දින රු. 32,447,463.00 ක වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ අතර එකතුව රු. 24,765,167.00 ක ගෙවීම් ලබා ගැනීමෙන් අනතුරුව අදාල කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් කාර්යයන් අතරමග නවතා දමා තිබුණි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය කාර්යසාධන බැදුම්කරය අදාල වලංගු කාල සීමාව තුල මුදල් කර ගැනීමට සහ අදාල කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	පවත්නා වාර්තාවලට අනුව කාර්ය සාධන බැදුම්කරයේ වටිනාකම රු. 1,625,000.00 ක් වේ. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 85% ක් හා 76% ක් වේ. තවද වැඩ ඉංජිනේරු විසින් සහතික කර සිදු කරන ලද කාර්යයේ සත්‍ය වටිනාකම රු. 28,919,262.29 ක් වන අතර ගෙවූ සම්පූර්ණ වටිනාකම රු. 24,765,167.38 ක් වේ. එබැවින් මේ සම්බන්ධයෙන් කිසිදු

		අලාභයක් සිදුවී ඇති බවට නිරීක්ෂණය නොවේ.
4.4 මානව සම්පත් කළමනාකරණය		
(අ)	මහාචාර්යවරුන්ගෙන් 19ක් ජ්‍යේෂ්ඨ කතිකාචාර්ය හා කතිකාචාර්ය පුරප්පාඩු 65 ක් පැවති අතර මෙය සිසුන්ගේ අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා අහිතකර ලෙෂ බලපා තිබුණි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය 2016 ජූලි 31 දින වන විටත් මෙම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.	එකඟ නොවෙමි. විශ්වවිද්‍යාලය 2012 සිට 2015 දක්වා අවස්ථා ගණනාවකදී අධ්‍යයන හා අනධ්‍යන සහය කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පලකරන ලදි. කෙසේ වෙනත් පහත හේතු නිසා කාර්ය මණ්ඩලය පුරප්පාඩු පිරවීම සඳහා පත්වීම් සිදු නොකරන ලදි. • සමහර විෂය ක්ෂේත්‍රයන් සඳහා අදාල සුදුසුකම් සහිත ඉල්ලුම්කරුවන් අයදුම්කරුවන් අයදුම් කර නොතිබුණි. • විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින අඩු ආකර්ෂණීය වැටුප් පැකේජයන් හේතුවෙන් වෛද්‍ය ප්‍රභේදය යටතේ සුදුසුකම් ලත් අයගෙන් ලැබෙන ප්‍රතිචාර ඉතා අවම වීම. • සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ පවතින මහාචාර්යය තනතුරු පුරප්පාඩු සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් මහාචාර්ය/ ජ්‍යේෂ්ඨ කතිකාචාර්ය මගින් පිරවීමට කටයුතු කර තිබුණි.

4.5 වත්කම් කළමනාකරණය		
(අ)	2012 වර්ෂයේදී රුපියල් මිලියන 2.875 ක් වැයකර කොටස් **අටකින්යුක්ත** "පඨක **සැකසුම්ජ්කකය**" නමින් වෛද්‍ය උපකරණයක් මිලදී ගෙන තිබුණද **එයටඅවශ්‍ය** ප්‍රදාන කොටස මිලදී ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් මිලදී ගත් දිනයේ සිට සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ප්‍රයෝජනයකට නොගෙන පැවතුණි.	එකඟ වෙමි. "පඨක **සැකසුම්ජ්කකයේ**" ප්‍රධාන කොටස මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
(ආ)	විශ්වවිද්‍යාලය විසින් රු. 2,994,370.00 ක මුදලක් වැයකර 2012 ජූලි 04 දින මිලදී ගත් මෘත ශරීරාගාර ශීතකිරීමේ යන්ත්‍රය මානව ජීව විද්‍යා අධ්‍යයනාංශයේ ව්‍යවච්ඡේද විද්‍යාගාරය වෙත භාරදීමට කටයුතු කළද එම උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 10KVAවිදුලිජනක යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් 2016 අප්‍රේල් 07 දින දක්වා මෙය ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.	එකඟ නොවෙමි. මෙය මිලදී ගත් දින සිට ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර විදුලිබල උච්චාවචනය හේතුවෙන් කෙටි කාලයකට තාවකාලිකව මෙහෙයුම් ක්‍රියාත්මක නොවුණි. එය 10KVAවිදුලිජනක යන්ත්‍රයක් සවිකිරීමෙන් පසු ක්‍රියාත්මක වන ලදී.
5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය		
	2003 ජූනි 02 දිනැති හා අංක පී. ඊ. ඩි / 02 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තියට අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත සමාලෝචිත වර්ෂය සඳහා වන අවසන් ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කල යුතුව පැවතුණි. කෙසේ වෙතත් සමාලොචිත වර්ෂය සඳහා වන විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් 2016 අප්‍රේල් 04 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.	එකඟ වෙමි. 2015 වර්ෂය සඳහා වන අවසාන ගිණුම් 2015 පෙබරවාරි මස අවසන් වන විටත් අවසන් කර තිබූ අතර එය 2015.03.24 දින පැවති 263 වන පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි.
5.2 සංයුක්ත සැලැස්ම		
	2003 ජූනි 02 දිනැති හා අංක පී. ඊ. ඩි / 12 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට පූර්ව වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනයක් ඇතුලත් කර නොතිබුණි. තවද ලගා කරගත යුතු ඉලක්ක වලට අදාලව මූල්‍ය වටිනාකම් සඳහන් කර නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.	එකඟ වෙමි. මූල්‍ය වටිනාකම් ක්‍රියාකාරකම් සැලැස්මේ ඇතුලත් කරනු ඇති අතර එය ඉදිරියේදී ඇගයීමට ලක් කරනු ලැබේ.

5.3 ක්‍රියාකාරකම් සැලැස්ම		
(අ)	2014 පෙබරවාරි 17 අංක 01/20 14 දිනැති පොදු මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සමාලොචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරකම් සැලැස්මේ යාවත්කාලීන කරන ලද ආයතන ධූරාවලිය, අනුමත හා වර්තමානය වන විට තත්‍ය කාර්යය මණ්ඩලය හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත්කර නොතිබුණි.	සටහන් කරගනු ලැබූ අතර ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ.
(ආ)	සමාලොචිත වර්ෂය සඳහා ක්‍රියාකාරකම් සැලැස්මේ ඇතුලත් කර ඇති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය ඇගයීම සඳහා ක්‍රියාකාරී වාර්තා විශ්වවිද්‍යාලය විසින් සකස් කර නොතිබුණි.	සටහන් කරගනු ලැබූ අතර ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ.
(ඇ)	සමාලොචිත වර්ෂය සඳහා ක්‍රියාකාරකම් සැලැස්මේ කලා හා සංස්කෘත පීඨය ඇතුලත් කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.	මෙය අත්වැරදීමකින් සිදුවී ඇති අතර එය ඊලඟ වර්ෂය සඳහා වන ක්‍රියාකාරකම් සැලැස්මේ ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.
5.4 ප්‍රසම්පාදන සැලැස්ම		
	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා 4.2.3 වගන්තිය ප්‍රකාරව වර්ෂ 3ක් ඇතුලත සපුරාගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුලත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කලයුතු වුවද එසේ කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට විශ්වවිද්‍යාලය වර්ෂයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර තිබුණි.	එකඟ වෙමි. සාමාන්‍යයෙන් වර්ෂයක කාලයක් සඳහා විශ්වවිද්‍යාලය ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලැබේ. කෙසේ වෙතත් 2015 වර්ෂයේ සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
5.5 පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම්		
	2015 ජූනි මස නිකුත් කරන ලද විගණන විමසුම් 24 කින් විගණන විමසුම් 03කට පමණක් 2016 ජූනි 30 වන විට පිළිතුරු ලබාදී නොතිබුණි.	එකඟ වෙමි. විගණන විමසුම් 6 කින් 3ක් සඳහා පිළිතුරු ලබාදුන් අතර ඉතිරි විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට අදාළ තොරතුරු මේ වන විටත් ලබා ගනිමින් පවතී. මේ සඳහා පිළිතුරු ඉතා ඉක්මනින් ලබා දෙනු ලැබේ.

5.6 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම	
2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා එහි වාර්ථාව 2016 මාර්තු 17 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය විසින් එවැනි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබූ අතර භාණ්ඩ සමීක්ෂණය ද කර නොතිබුණි.	එකඟ වෙමි. 2015 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය අවසන් කර එහි වාර්ථාව පාලක සභාවට ඉදිරිපත් කර ඇත.
6 පද්ධති හා පාලනයන්	
විගණනය අතරතුර පද්ධති හා පාලනයන්ට අදාලව නිරීක්ෂණය කරන ලද දූර්වලතාවයන් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට කලින් කල යොමු කර ඇත. පහත ක්ෂේත්‍රයන්හි පද්ධති පාලනයට අදාළව විශේෂ අවධානය යොමු කළ යුතුය.	
(අ) ස්ථාවර වත්කම් පාලනයඃ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල සාධාරණ අගය ඉදිරිපත් කිරීම. (ආ) කොන්ත්‍රාත් පරිපාලනය ඃ ප්‍රමාද ගාස්තු අය කිරීම, දිගුකිරීම් සඳහා අනුමැතිය ලබාදීම සහ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි හා එකඟ වීම.	සටහන් කර ගතිමි.

මහාචාර්ය ටී. ජයසිංහම්
උප කුලපති
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව